# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 11,661 — 1959 පෙබරවාරි 6 වැනි සිකුරාදා — 6.2.1959**

**(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිඩ කරන ලදී)**


# I වැනි කොටස: (I) වැනි ජේදය—සාමාන්‍ය

## මිල පාලන දැන්වීම්

**ඇම්. ඇල්. 1959/1 වෙනි අංකය දරණ ආහාර මිල නියෝගය.**

අතිරේක ආහාර ද්‍රව්‍ය (උම්බලකඩ).

**1950 අංක 29 දරණ මිල පාලන පනත**

**නියෝගය**

මාතලේ පාලන දිස්ත්‍රික්කයේ සහකාර මිළ (ආහාර) පාලක තැන්පත් බන්දුල සෝමසිරි ද සිල්වා වන මම, 1950 අංක 29 දරණ මිළ පාලන පනතේ 3 (2) දරණ වගන්තිය සමග කියවිය යුතු 4 වෙනි වගන්තිය යටතේ මා වෙත පැවරී තිබෙන බලතල අනුව—

(1) 1958 අගෝස්තු 19 වෙනි දින අංක 11,476 දරණ ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළකරන ලද 1958 අගෝස්තු 16 වෙනි දින අංක ඇම්. ඇල්. 1958/කේ දරණ මාගේ ආහාර මිළ නියෝගයේ 2 වෙනි උපලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් උම්බලකඩ පිළිබඳව එම උපලේඛනයේ 3 සහ 4 වෙනි තීරවල පිළිවෙලින් දක්වෙන තොග වෙළෙන්දෙකු තොග වශයෙන් විකිණීමේ වැඩිම මිළද, සිල්ලර වෙළෙන්දෙකු සිල්ලර වශයෙන් විකිණීමේ වැඩිම මිළද, මෙම නියෝගයෙන් 1959 පෙබරවාරි 1 වෙනි දින සිට අවලංගු කරමි.

(2) තොග වෙළෙන්දෙකු තොග වශයෙන් විකිණීමේදී උම්බලකඩ ශුද්ධ බර හොණ්ඩරයක්ද, සිල්ලර වෙළෙන්දෙකු සිල්ලර වශයෙන් පාරිභෝගිකයෙකුට විකිණීමේදී උම්බලකඩ ශුද්ධ බර රාත්තලක්ද, මතු පළවෙන 1 වෙනි උපලේඛනයේ පැහැදිළිව දක්වෙන පරිදි මාතලේ පාලන දිස්ත්‍රික්ක සීමාවන් තුළ විකිණිය හැකි වැඩිම මිළ 2 වෙනි උපලේඛනයේ 3 වෙනි සහ 4 වෙනි තීරවල පිළිවෙළින් සඳහන්කර තිබෙන මිළ ගණන් බව මෙම නියෝගයෙන් නියම කරමි.

(3) තවද, මෙම නියෝගයේ කාර්‍ය සඳහා—

(අ) උම්බලකඩ ඕනෑම ප්‍රමාණයක් නැවත විකිණීම සඳහා විකිණීම තොග වශයෙන් විකිණීමක් ලෙස සලකන බවත් ;

(ආ) උම්බලකඩ ඕනෑම ප්‍රමාණයක් පරිභෝගය පිණිස හෝ පාවිච්චිය පිණිස විකිණීම සිල්ලර වශයෙන් විකිණීමක් ලෙස සලකන බවත් ;

(ඇ) තොග වශයෙන් විකුණන ශුද්ධ බර හොණ්ඩරයකට අඩු හෝ වැඩි ඕනෑම උම්බලකඩ ප්‍රමාණයකට ගෙවිය යුතු වැඩිම මුදල ගණන් ගනු ලබන්නේ මෙහි සඳහන් ශුද්ධ බර හොණ්ඩරයක් තොග වශයෙන් විකිණීමේ වැඩිම මිළ අනුව බවත් මෙම නියෝගයෙන් නියම කරමි.

(4) එසේම, මාතලේ පාලන දිස්ත්‍රික්කය තුළ උම්බලකඩ වෙන ද්‍රව්‍යයක් සමග මිශ්‍ර කිරීමෙන් බාලකොට කිසිවකු විසින් නොවිකිණිය යුතු බව නියම කරමි.

(5) තවද, මාතලේ පාලන දිස්ත්‍රික්කය තුළ යම් ස්ථානයක හෝ යම් වාහනයක, 2 වෙනි උපලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් උම්බලකඩ සිය ස්වාමිත්වයේ හෝ පාලනය යටතේ හෝ තබා ගෙන සිටින සෑම වෙළෙන්දෙකුම එම ප්‍රදේශය සඳහා මෙම නියෝගයෙන් නියමිත වැඩිම මිළ ගණන් සටහන් කරන ලද දැන්වීමක් එකී ස්ථානයේ හෝ වාහනයේ ප්‍රකටව පෙනෙන පරිදි තැබිය යුතු බව නියම කරමි.

(6) එසේම මෙම නියෝගයේ කාර්‍ය සඳහා '' රාත්තල '' හෙවත් '' රා.'' යන්නෙන් සළකනු ලබන්නේ ඇවර්දුපෝයි බර ක්‍රමය අනුව සම්මත රාත්තලේ බර බවද නියම කරමි.

393—ජේ. ඇන්. ආර් 172—5,400 (2/59)

(7) එසේම, මාතලේ පාලන දිස්ත්‍රික්කය තුළ උම්බලකඩ තොග වශයෙන් විකුණන සෑම තැනැත්තකු හා සිල්ලර වශයෙන් විකුණන සෑම තැනැත්තෙකුම මිළයට ගන්නා ඉල්ලුවහොත්, පහත සඳහන් විස්තර, එනම් :—

(අ) විකුණූ දිනය ;

(ආ) එම ද්‍රව්‍යයන් විකුණූ ප්‍රමාණය (බර) ;

(ඇ) විකුණූ ප්‍රමාණය සඳහා ගෙවූ මුදල ;

(ඈ) වෙළඳාමේ සවභාවය, එනම්, තොග වශයෙන්ද සිල්ලර වශයෙන්ද යන වග ඇතුළත් කුවිතාන්සියක් දිය යුතු බවද නියම කරමි.

(8) උම්බලකඩ විකුණන විට එය ඔතා හෝ බහා දෙන යම්කිසි දෙයක් වෙතොත් එහි මිළත් 2 වෙනි උපලේඛනයේ 3 වෙනි සහ 4 වෙනි තීරවල සඳහන් වැඩිම මිළ ගණන්වලට ඇතුළත්වී ඇති බවද නියම කරමි.

1959 ජනවාරි 30 වෙනි දින පස්වරු 6.30ට මාතලේදී අත්සන් තබන ලදී.

බන්දුල ඇස්. ද සිල්වා,
මාතලේ පාලන දිස්ත්‍රික්කයේ සහකාර මිළ (ආහාර) පාලක.

## 1 වෙනි උපලේඛනය

අංක 1 දරණ කොට්ඨාශය—

කුඹියන්ගොඩ හැර මාතලේ පළාත් පාලන සභා කොට්ඨාශය.

අංක 2 දරණ කොට්ඨාශය—

(අ) මාතලේ පළාත් පාලන සභා කොට්ඨාශය, ඕව්ලිකන්ද, පරණගන්තැන්න, වැහිගල හැර මාතලේ දකුණු ප්‍රාදේශීය ආදයම් නිලධාරිතැනගේ කොට්ඨාශය ;

(ආ) පොල්වත්තේකන්ද සහ වෙලන්ගහවත්ත හැර මාතලේ නැගෙනහිර ප්‍රාදේශීය ආදයම් නිලධාරිතැනගේ කොට්ඨාශයට අයත් මාතලේ පල්ලේසිය පත්තුව ;

(ඇ) මාතලේ පලාත් පාලන සභා කොට්ඨාශයේ කුඹියන්ගොඩ.

අංක 3 දරණ කොට්ඨාශය—

(අ) මාතලේ උතුරු ප්‍රාදේශීය ආදයම් නිලධාරිතැනගේ කොට්ඨාශය ;

(ආ) මාතලේ නැගෙනහිර ප්‍රාදේශීය ආදයම් නිලධාරිතැනගේ කොට්ඨාශයේ ගහල පල්ලේසිය පත්තුව සහ අඹන්ගහ කෝරලය ;

(ඇ) මාතලේ දකුණු ප්‍රාදේශීය ආදයම් නිලධාරිතැනගේ කොට්ඨාශයේ පරණගන්තැන්න, වැහිගල, ඕව්ලිකන්ද සහ මාතලේ නැගෙනහිර ප්‍රාදේශීය ආදයම් නිලධාරිතැනගේ කොට්ඨාශයේ පොල්වත්තේකන්ද සහ වෙලන්ගහවත්ත.

අංක 4 දරණ කොට්ඨාශය—

මාතලේ නැගෙනහිර ප්‍රාදේශීය ආදයම් නිලධාරිතැනගේ කොට්ඨාශයේ ගහල උඩසිය පත්තුව, ලග්ගල උඩසිය පත්තුව සහ ලග්ගල පල්ලේසිය පත්තුව.

## 2 වෙනි උපලේඛනය

| 1 වෙනි තීරය<br>විස්තර | 2 වෙනි තීරය<br>කොට්ඨාශය | 3 වෙනි තීරය<br>තොග වෙළෙන්දෙකු විසින් තොග වශයෙන් ශුද්ධ බර හොණ්ඩරයක් විකිණිය හැකි වැඩිම මිළ<br>රු. ශ. | 4 වෙනි තීරය<br>සිල්ලර වෙළෙන්දෙකු විසින් සිල්ලර වශයෙන් ශුද්ධ බර රාත්තලක් විකිණිය හැකි වැඩිම මිළ<br>රු. ශ. |
|---|---|---|---|
| උම්බලකඩ (සියළුම වර්ගවල)... | 1 ... | 244 95 ... | 2 45 |
| | 2 ... | 245 15 ... | 2 46 |
| | 3 ... | 245 30 ... | 2 47 |
| | 4 ... | 245 70 ... | 2 49 |

සැලකිය යුතුයි.—මේ මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍යය විකිණීමේ නියමිත මිළ නොවේ. මේවා ඒ ද්‍රව්‍ය විකිණිය හැකි වැඩිම මිළ වේ. එකී මිළට වැඩියෙන් නොවිකිණිය යුතුයි.

---

ඇප්/පි/ඇම්/15 වැනි අංකය දරණ මිළ නියෝගය. අතිරේක ආහාර ද්‍රව්‍ය (උම්බලකඩ).

## 1950 අංක 29 දරණ මිළ නියෝගය

පුත්තලම සහ හලාවත දිස්ත්‍රික්කයන්හි සහකාර මිල (ආහාර) පාලක තැනැපත් ජෝන් වින්සන්ට් ඥානප්‍රගාසම් වන මම, 1950 අංක 29 දරණ මිල පාලන පනතේ 3 (2) වෙනි වගන්තියත් සමග කියවිය යුතු 4 වගන්තියෙන් මට පැවරී ඇති බලතල අනුව—

(1) 1958 අගෝස්තු 19 වෙනි දින අංක 11,476 දරණ ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 1958 අගෝස්තු 16 වෙනි දින අංක ඇප්/පි/ඇම්/9 දරණ ආහාර මිල නියෝගයේ උපලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් උම්බලකඩ පිළිබඳව එම උපලේඛනයේ 3 සහ 4 වෙනි තීරවල පිළිවෙළින් දක්වෙන තොග වෙළෙන්දෙකු තොග වශයෙන් විකිණීමේ වැඩිම මිලද, සිල්ලර වෙළෙන්දෙකු සිල්ලර වශයෙන් විකිණීමේ වැඩිම මිලද, මෙම නියෝගයෙන් 1959 පෙබරවාරි 1 වෙනි දින සිට අවලංගු කරමි.

(2) තොග වෙළෙන්දෙකු තොග වශයෙන් විකිණීමේදී උම්බලකඩ ශුද්ධ බර හොණ්ඩරයක්ද, සිල්ලර වෙළෙන්දෙකු සිල්ලර වශයෙන් පාරිභෝගිකයෙකුට විකිණීමේදී උම්බලකඩ ශුද්ධ බර රාත්තලක්ද, උපලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් ස්ථාන තුළ විකිණිය හැකි වැඩිම මිල 1959 පෙබරවාරි 1 වෙනි දින සිට මේ උපලේඛනයේ 3 වෙනි සහ 4 වෙනි තීරයන්හි පිළිවෙළින් සඳහන් කර තිබෙන මිල ගණන් බව මෙම නියෝගයෙන් නියම කරමි.

(3) තවද, මෙම නියෝගයේ කාර්ය සඳහා—

(අ) උම්බලකඩ ඕනෑම ප්‍රමාණයක් නැවත විකිණීම සඳහා විකිණීම තොග වශයෙන් විකිණීමක් ලෙස සලකන බවත් ;

(ආ) උම්බලකඩ ඕනෑම ප්‍රමාණයක් පරිභෝගය පිණිස හෝ පාවිච්චිය පිණිස විකිණීම සිල්ලර වශයෙන් විකිණීමක් ලෙස සලකන බවත් ;

(ඇ) තොග වශයෙන් විකුණන ශුද්ධ බර හොණ්ඩරයකට අඩු හෝ වැඩි ඕනෑම උම්බලකඩ ප්‍රමාණයකට ගෙවිය යුතු වැඩිම මුදල ගණන් ගනු ලබන්නේ මෙහි සඳහන් ශුද්ධ බර හොණ්ඩරයක් තොග වශයෙන් විකිණීමේ වැඩිම මිළ අනුව බවත් මෙම නියෝගයෙන් නියම කරමි.

(4) එසේම උපලේඛනයේ පළවෙනි තීරයේ සඳහන් ස්ථාන ඇතුළත උම්බලකඩ වෙන ද්‍රව්‍යයක් සමඟ මිශ්‍ර කිරීමෙන් බාලකොට කිසිවෙකු විසින් නොවිකිණිය යුතු බව නියම කරමි.

(5) තවද, උපලේඛනයේ 1 තීරයේ සඳහන් ස්ථාන තුළ යම් ස්ථානයක හෝ වාහනයක උපලේඛනයේ 2 වෙනි තීරයේ සඳහන් උම්බලකඩ සිය ස්වාමිත්වය හෝ පාලනය යටතේ තබාගෙන සිටින සෑම වෙළෙන්දෙකුම මෙම නියෝගයෙන් නියමිත වැඩිම මිල ගණන් සටහන් කරන ලද දැන්වීමක් එකී ස්ථානයේ හෝ වාහනයේ ප්‍රකටව පෙනෙන පරිදි තැබිය යුතු බව නියම කරමි.

(6) එසේම, මෙම නියෝගයේ කාර්ය සඳහා '' රාත්තල '' හෙවත් '' රා. '' යන්නෙන් සලකනු ලබන්නේ ඇවර්දූපොයි බර ක්‍රමය අනුව සම්මත රාත්තලේ බර බවද නියම කරමි.

(7) එසේම, උපලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් ස්ථාන තුළ උම්බලකඩ තොග වශයෙන් විකුණන සෑම තැනැත්තෙකු හා සිල්ලර වශයෙන් විකුණන සෑම තැනැත්තෙකුම මිළයට ගන්නා ඉල්ලුවහොත් පහත සඳහන් විස්තර, එනම් :—

(අ) විකුණූ දිනය ;
(ආ) විකුණූ උම්බලකඩ ප්‍රමාණය (බර) ;
(ඇ) විකුණූ ප්‍රමාණය සඳහා ගෙවූ මුදල ;
(ඈ) වෙළඳාමේ ස්වභාවය, එනම්, තොග වශයෙන්ද සිල්ලර වශයෙන්ද යන වග ඇතුළත් කුවිතාන්සියක් දිය යුතු බවද නියම කරමි.

(8) උම්බලකඩ විකුණන විට එය ඔතා හෝ බහා දෙන යම්කිසි දෙයක් වෙතොත් එහි මිළත් උපලේඛනයේ 3 වෙනි සහ 4 වෙනි තීරවල සඳහන් වැඩිම මිළ ගණන් වලට ඇතුළත්වී ඇති බවද නියම කරමි.

1959 ජනවාරි 31 වෙනි දින පෙරවරු 11ට පුත්තලමේදී අත්සන් තබන ලදී.

ජෝ. වී. ඥානප්‍රගාසම්,
සහකාර මිළ (ආහාර) පාලක, පුත්තලම.

## උපලේඛනය

| 1 වෙනි තීරය<br>ප්‍රදේශය | 2 වෙනි තීරය<br>විස්තර | 3 වෙනි තීරය<br>තොග වෙළෙන්දෙකු විසින් දළ බර හොණ්ඩරයක් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ<br>රු. ශ. | 4 වෙනි තීරය<br>සිල්ලර වෙළෙන්දෙකු විසින් ශුද්ධ බර රාත්තලක් සිල්ලර වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ<br>රු. ශ. |
|---|---|---|---|
| (1) දකුණු පිටිගල් කෝරළයේ ප්‍රාදේශික ආදායම් නිලධාරි තැනගේ සියලුම ප්‍රදේශ ... | උම්බලකඩ (සියළුම වර්ගවල) | 246 76 ... | 2 47 |
| (2) උඩප්පුව, බත්තුළුඔය සහ පුලිච්චකුලම හැර උතුරු පිටිගල් කෝරළේ ප්‍රාදේශික ආදායම් නිලධාරිතැනගේ සියලුම ප්‍රදේශ | උම්බලකඩ (සියළුම වර්ගවල) | 247 54 ... | 2 47 |
| (3) පුත්තලම් උපනගර සභාවේ ප්‍රදේශය සහ හලාවත උතුරු පිටිගල් කෝරළේ ප්‍රාදේශික ආදායම් නිලධාරි තැනගේ කොට්ඨාශයට අයිති උඩප්පුව, බත්තුළුඔය සහ පුලිච්චිකුලම | උම්බලකඩ (සියළුම වර්ගවල) | 251 05 ... | 2 50 |
| (4) පුත්තලම උප නගර සභාවේ ප්‍රදේශය හැර පුත්තලම් පත්තු සහ ගුවට්හි ප්‍රාදේශික ආදායම් නිලධාරි තැනගේ සියලුම ප්‍රදේශ | උම්බලකඩ (සියළුම වර්ගවල) | 252 60 ... | 2 50 |
| (5) ඒත්තාලේ සහ ආණමඩුව ... ... ... | උම්බලකඩ (සියළුම වර්ගවල) | 253 08 ... | 2 50 |
| (6) ඒත්තාලේ හැර කල්පිටිය ප්‍රාදේශික ආදායම් නිලධාරි තැනගේ සියලුම ප්‍රදේශද ආණමඩුව හැර දෙමළ හත්පත්තු ප්‍රදේශික ආදායම් නිලධාරි තැනගේ සියලුම ප්‍රදේශ | උම්බලකඩ (සියළුම වර්ගවල) | 253 55 ... | 2 50 |

**සැලකිය යුතුයි.**—මේ මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණීමේ නියමිත මිළ නොවේ. මේවා ඒ ඒ ද්‍රව්‍ය විකිණිය හැකි ඉතාම වැඩිමිළ ගණන්ය. මේ මිළ ගණන්වලට ඉහළින් ඒ ද්‍රව්‍ය විකිණිය නො හැක.

---

**ආර්/17/1959 වෙනි අංකය දරණ ආහාර මිල නියෝගය** **අතිරේක ආහාර ද්‍රව්‍ය (උම්බලකඩ)**

### 1950හේ අංක 29 දරණ මිළ පාලන පනත

#### නියෝගය

රත්නපුර පාලන දිස්ත්‍රික්කයේ සහකාර (ආහාර) මිළ පාලක තැන්පත් හේවා ඩැනී වීරරත්න වන මම, 1950 අංක 29 දරණ මිළ පාලන පනතේ 3 (2) දරණ වගන්තිය සමග කියවිය යුතු 4 වෙනි වගන්තිය යටතේ මා වෙත පැවරී තිබෙන බලතල අනුව —

(1) 1958 අගෝස්තු මස 23 වැනි දින අංක 11,480 දරණ ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 1958 අගෝස්තු මස 19 වෙනි දින අංක ආර්/10/1958 දරණ ආහාර මිළ නියෝගයේ උපලේඛනයේ 2 වෙනි තීරයෙහි සඳහන් උම්බලකඩ පිළිබඳව එම උපලේඛනයේ 3 වෙනි 4 වෙනි තීරවල පිළිවෙලින් දක්වෙන තොග වෙළෙන්දෙකු තොග වශයෙන් විකිණීමේ වැඩිම මිළද, සිල්ලර වෙළෙන්දෙකු සිල්ලර වශයෙන් විකිණීමේ වැඩිම මිළද, මෙම නියෝගයෙන් 1959 පෙබරවාරි 1 වෙනි දින සිට අවලංගු කරමි.

(2) තොග වෙළෙන්දෙකු තොග වශයෙන් විකිණීමේ දී උම්බලකඩ ශුද්ධ බර හොණ්ඩරයක්ද, සිල්ලර වෙළෙන්දෙකු සිල්ලර වශයෙන් පාරිභෝගිකයෙකුට විකිණීමේදී උම්බලකඩ ශුද්ධ බර රාත්තලක්ද, මේ උපලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් ප්‍රදේශයන් ඇතුළත විකිණිය හැකි වැඩිම මිළ 1959 පෙබරවාරි 1 වෙනි දින සිට මෙහිම 3 වෙනි සහ 4 වෙනි තීරයන්හි පිළිවෙලින් සඳහන් කර තිබෙන මිළ ගණන් බව මෙම නියෝගයෙන් නියම කරමි.

(3) තවද, මෙම නියෝගයේ කාර්‍ය සඳහා—

(අ) උම්බලකඩ ඕනෑම ප්‍රමාණයක් නැවත විකිණීම් සඳහා විකිණීම තොග වශයෙන් විකිණීමක් ලෙස සළකන බවත්;

(ආ) උම්බලකඩ ඕනෑම ප්‍රමාණයක් පරිභෝගය පිණිස හෝ පාවිච්චිය පිණිස විකිණීම සිල්ලර වශයෙන් විකිණීමක් ලෙස සලකන බවත්;

(ඇ) තොග වශයෙන් විකුණන ශුද්ධ බර හොණ්ඩරයකට අඩු හෝ වැඩි ඕනෑම උම්බලකඩ ප්‍රමාණයකට ගෙවිය යුතු වැඩිම මුදල ගණන් ගනු ලබන්නේ මෙහි සඳහන් ශුද්ධ බර හොණ්ඩරයක් තොග වශයෙන් විකිණීමේ වැඩිම මිළ අනුව බවත් මෙම නියෝග යෙන් නියම කරමි.

(4) එසේම මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරණු ලැබූ සෑම ප්‍රදේශයකම උම්බලකඩ වෙන ද්‍රව්‍යයක් සමග මිශ්‍ර කිරීමෙන් බාල කොට කිසිවෙකු විසින් නොවිකිණිය යුතු බව නියම කරමි.

(5) තවද, මෙම නියෝගයෙන් වැඩිම මිළ නියම කරණු ලැබූ සෑම ප්‍රදේශයකම යම් ස්ථානයක හෝ වාහනයක උපලේඛනයේ 2 වෙනි තීරයේ සඳහන් උම්බලකඩ සිය ස්වාමිත්වයේ හෝ පාලනය යටතේ තබාගෙන සිටින සෑම වෙළෙන්දෙකුම මෙම නියෝගයෙන් නියමිත වැඩිම මිළ ගණන් සටහන් කරන ලද දැන්වීමක් එකී ස්ථානයේ හෝ වාහනයේ ප්‍රකටව පෙනෙන පරිදි තැබිය යුතු බව නියම කරමි.

(6) එසේම, මෙම නියෝගයේ කාර්‍ය සඳහා '' රාත්තල '' හෙවත් '' රා. '' යන්නෙන් සලකනු ලබන්නේ ඇවර්දුපොයි බර ක්‍රමය අනුව සම්මත රාත්තලේ බර බවද නියම කරමි.

(7) එසේම, මෙම නියෝගයෙන් වැඩිම මිළ නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම උම්බලකඩ තොග වශයෙන් විකුණන සෑම තැනැත්තෙකු හා සිල්ලර වශයෙන් විකුණන සෑම තැනැත්තෙකුම මිළයට ගන්නා ඉල්ලුවහොත් පහත සඳහන් විස්තර, එනම් :—

(අ) විකුණූ දිනය;

(ආ) විකුණූ උම්බලකඩ ප්‍රමාණය (බර);

(ඇ) විකුණූ ප්‍රමාණය සඳහා ගෙවූ මුදල;

(ඈ) වෙළඳාමේ ස්වභාවය, එනම්, තොග වශයෙන්ද සිල්ලර වශයෙන්ද යන වග ඇතුළත් කුවිතාන්සියක් දිය යුතු බවද නියම කරමි.

(8) උම්බලකඩ විකුණන විට එය ඔතා හෝ බහා දෙන යම්කිසි දෙයක් වෙතොත් එහි මිළත් උපලේඛනයේ 3 වෙනි සහ 4 වෙනි තීරවල සඳහන් වැඩිම මිළ ගණන්වලට ඇතුළත් වී ඇති බවද නියම කරමි.

1959 ජනවාරි මස 30 වෙනි දින පස්වරු 4.30 ට රත්නපුර කච්චේරියේදී අත්සන් තබන ලදී.

එච්. ඩී. වීරරත්න,
රත්නපුර දිස්ත්‍රික්කයේ සහකාර (ආහාර) මිළ පාලක තැන.

## උපලේඛනය

| 1 වෙනි තීරය<br>ප්‍රදේශය | 2 වෙනි තීරය<br>විස්තර | 3 වෙනි තීරය<br>තොග වෙළෙන්දෙකු විසින් තොග වශයෙන් ශුද්ධ බර හොණ්ඩරයක් විකිණිය හැකි වැඩිම මිළ<br>රු. ශ. | 4 වෙනි තීරය<br>සිල්ලර වෙළෙන්දෙකු විසින් සිල්ලර වශයෙන් ශුද්ධ බර රාත්තලක් විකිණිය හැකි වැඩිම මිළ<br>රු. ශ. |
|---|---|---|---|
| (1) (අ) රත්නපුර පළාත් ආණ්ඩු සභා ප්‍රදේශය, (ආ) ගවරගිරිය වසම හැර කුකුළු කෝරළේ පල්ලේ පත්තුව, (ඇ) එරත්න, ගිලීමලේ උතුර, ගිලීමලේ දකුණ සහ කුඩාව යන ගම්මුලාදෑනි වසම් හැර කුරුවිටි කෝරළේ උඩ පත්තුව සහ කරඳන සහ කලටුවාව නැගෙනහිර යන ගම්මුලාදෑනි වසම් | උම්බලකඩ (සියලුම වර්ග වල) | 242 0 ... | 2 42 |
| (2) කලටුවාව නැගෙනහිර ගම්මුලාදෑනි වසම හැර කුරුවිටි කෝරළේ පල්ලේ පත්තුව සහ කරඳන ගම්මුලාදෑනි වසම හැර කුරුවිටි කෝරළේ මැද පත්තුව | උම්බලකඩ (සියලුම වර්ග වල) | 241 75 ... | 2 41 |
| (3) (අ) නවදුන් කෝරළේ උඩ පත්තුව, මැද පත්තුව, සහ පල්ලේ පත්තුව, (ආ) කුකුළු කෝරළේ මැද පත්තුව | උම්බලකඩ (සියලුම වර්ග වල) | 242 15 .... | 2 43 |
| (4) (අ) බලන්ගොඩ පලාත් ආණ්ඩු සභා ප්‍රදේශය, (ආ) රක්වාන සුළු නගර සභා ප්‍රදේශය, (ඇ) කුරුවිටි කෝරළේ එරත්න, ගිලීමලේ උතුර, ගිලීමලේ දකුණ, සහ කුඩාව යන ගම්මුලා දෑනි වසම්, (ඈ) කල්තොට වසම හැර කඩවත මැද කෝරළේ හෙල පල්ලේ පළාත, හෙල උඩ පළාත සහ උඩුවග්ගම් පතතුව, (ඉ) අටකලං කෝරළේ පන්නිල් පතතුව, මැද පත්තුව සහ පල්ලේ බැද්ද ගම්මුලාදෑනි වසම, (ඊ) කුකුළු කෝරළේ උඩ පතතුව සහ ගවරගිරිය ගම් මුලාදෑනි වසම | උම්බලකඩ (සියලුම වර්ග වල) | 242 25 ... | 2 44 |
| (5) (අ) කොලොන්නා කෝරළේ කොලොන්නා ගම් පත්තුව සහ දියපොට ගම් පත්තුව, (ආ) කඩවත කෝරළේ තල්පිටි ගම් පත්තුව, (ඇ) අටකලං කෝරළේ පල්ලේ බැද්ද ගම් මුලාදෑනි වසම හැර දෙපත්තුව, (ඈ) මැද කෝරළේ කල්තොට වසම | උම්බලකඩ (සියලුම වර්ග වල | 242 50 ... | 2 45 |

**සැලකිය යුතුයි.**—මේ මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍යය විකිණීමේ නියමිත මිළ නොවේ. මේවා ඒ ද්‍රව්‍ය විකිණිය හැකි වැඩිම මිළ වේ. එකී මිළට වැඩියෙන් නොවකිණිය යුතුයි.

කේශු/. අංකය 1/59 දරණ ආහාර මිළ නියෝගය

අතිරේක ආහාර ද්‍රව්‍ය (උම්බලකඩ)

## 1950හේ අංක 29 දරණ මිළ පාලන පනත

### නියෝගය

කුරුණෑගල පාලන දිස්ත්‍රික්කයේ සහකාර (ආහාර) මිළ පාලක තැන්පත් විල්ප්‍රඩ් ප්‍රැන්සිස් ප්‍රදිනාන්දු වන මම, 1950හේ අංක 29 දරණ මිළ පාලන පනතේ 3(2) දරණ වගන්තිය සමඟ කියවියයුතු 4 වැනි වගන්තියෙන් මාවෙත පැවරී තිබෙන බලතල අනුව—

(1) අංක 11,476 හා 58.8.19 වැනි දින දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළකරණලද අංක කේශු/11/58 හා 58.8.15 වැනි දින දරණ ආහාර මිළ නියෝගයේ උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් උම්මලකඩ පිළිබඳව එම උපලේඛනයේ 2 වැනි හා 3 වැනි තීරයන්හි පිළිවෙලින් දක්වෙන තොග වෙළෙන්දෙකු විසින් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ හා සිල්ලර වෙළෙන්දෙකු විසින් විකියණි හැකි වැඩිම මිළද අද සිට මෙයින් අවලංගු කරමි.

(2) ඒ සඳහා මීට යාකර ඇති උප ලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් උම්මලකඩ තොග වෙළෙන්දකු විසින් තොග වශයෙන් විකිණීමේ දී දළ බර හොන්ඩරයක්ද, සිල්ලර වෙළෙන්දකු විසින් පාරිභෝගිකයෙකුට සිල්ලර වශයෙන් විකිණීමේදී සුද්ධ බර රාත්තලක්ද කුරුණෑගල පාලන දිස්ත්‍රික්කය ඇතුළත විකිණිය හැකි වැඩිම මිළ මේ දන් පටන්, මේ උපලේඛනයේ 2 වැනි හා 3 වැනි තීරවල අනු පිළිවලින් සඳහන් කර තිබෙන මිළ ගණන් බව මෙම නියෝගයෙන් නියම කරමි.

(3) තවද මෙම නියෝගයේ කර්ය සඳහා :—

(අ) උලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් උම්මලකඩ ඕනෑම ප්‍රමාණයක් නැවත විකිණීම සඳහා විකිණීම තොග වශයෙන් විකිණීමක් ලෙස සලකනු ලබන බවත්,

(ආ) උපලේඛනයේ සඳහන් උම්මලකඩ පරිභෝගය පිණිස හෝ පාවිච්චිය පිණිස හෝ දලබර හොන්ඩරයකට අඩු ඕනෑම ප්‍රමාණයක් විකිණීම සිල්ලර වශයෙන් විකිණීමක් ලෙස සලකනු ලබන බවත්, මෙම නියෝගයෙන් නියම කරමි.

(4) එසේම මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියමකරණු ලැබූ කුරුණෑගල පාලන දිස්ත්‍රික්කය තුළ උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් උම්මලකඩ වෙන ද්‍රව්‍යක් සමඟ මිශ්‍රකිරීමෙන් බාලකොට කිසිවෙකු විසින් නොවිකිණිය යුතුබව නියම කරමි.

(5) තවද මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරණු ලැබූ කුරුණෑගල පාලන දිස්ත්‍රික්කය තුළ යම් ස්ථානයක හෝ යම් වාහණයක උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් උම්මලකඩ සිය ස්වාමිත්වයේ හෝ පාලනය යටතේ හෝ තබාගෙන සිටින සෑම වෙළෙන්දෙකුම එම ප්‍රදෙශය සඳහා උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් උම්මලකඩ සම්බන්ධයෙන් මෙම නියෝගයෙන් නියමිත වැඩිම මිළ ගණන් සටහන් කරණලද දැන්වීමක් එකී ස්ථානයේ හෝ වාහණයේ ප්‍රකටව පෙනෙණ සේ තැබිය යුතු බව නියම කරමි.

(6) එසේම මෙම නියෝගයේ කාර්ය සඳහා "රාත්තල" හෙවත් "රා" යන්නෙන් සලකනු ලබන්නේ ඇවර්දුපොයි බර ක්‍රමය අනුව සම්මත රාත්තලේ බර බවද නියම කරමි.

(7) තවද මෙම නියෝගයෙන් වැඩිම මිළ නියම කරනු ලැබූ කුරුණෑගල පාලන දිස්ත්‍රික්කය තුළ උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් උම්මලකඩ තොග වශයෙන් විකුණන සෑම තැනැත්තෙකු හා උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් උම්මලකඩ සිල්ලර වශයෙන් විකුණන සෑම තැනැත්තෙකු විසින්ම මිළයට ගන්නා ඉල්ලුව හොත් පහත සඳහන් විස්තර, එනම් :—

(අ) විකුණූ දිනය;

(ආ) එම ද්‍රව්‍ය විකුණූ ප්‍රමාණය (බර අනුව) ;

(ඇ) විකුණූ ප්‍රමාණය සඳහා ගෙවූ මුදල;

(ඈ) වෙළෙඳාමේ ස්වභාවය, එනම් : වෙළෙඳාම තොග වශයෙන්ද සිල්ලර වශයෙන්ද, යනවග ඇතුළත් කුවිතාන්සියක් මිළයට ගන්නාට දියයුතු බවත් නියම කරමි.

(8) උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් උම්මලකඩ යම් ප්‍රමාණයක් විකුණන විට ඒ ද්‍රව්‍ය යම්කිසි දෙයක ඔතනු ලැබේ නම් එහි මිළත්, උප ලේඛනයේ 2 වැනි හා 3 වැනි තීරවල සඳහන් වැඩිම මිළ ගණන් බවට ඇතුළත් වන බවද නියම කරමි.

1959යේ පෙබරවාරි මස 3 වැනි දින පෙරවරු 10ට
කුරුණෑගල කච්චේරියේදී අත්සන්කරන ලදී.

ඩබ්ලිවු. ඇෆ්. ප්‍රදිනාන්දු,
කුරුණෑගල දිස්ත්‍රික්කයේ සහකාර (ආහාර) මිළ පාලක.

### උපලේඛනය

| 1 වැනි තීරය | 2 වැනි තීරය | 3 වැනි තීරය |
|---|---|---|
| විස්තර | තොග වෙළෙන්දෙකු විසින් දළබර හො. 1ක් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ | සිල්ලර වෙළෙන්දෙකු විසින් ශුද්ධ බර රාත්තලක් සිල්ලර වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ |
| | රු. ශ. | රු. ශ. |
| උම්මලකඩ ... ... ... ... | 246 96 ... | 2 48 |

**සැළකිය යුතුයි.**—මේ මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණීමේ නියමිත මිළ නොවේ. මේවා ඒ ද්‍රව්‍ය විකිණිය හැකි ඉතා වැඩිම මිළ ගණන්ය. මේ ගණන් වලට ඉහලින් ඒ ද්‍රව්‍ය විකිණිය නොහැකිය.

---

49 වැන් අංකය දරණ (ආහාර) මිළ නියොගය

අතිරේක අහාර ද්‍රව්‍ය (උම්බලකඩ)

## 1950 අංක 29 දරණ මිළ පාලන පනත

### නියෝගය

අනුරාධපුර දිස්ත්‍රික්කයේ සහකාර (ආහාර) මිළ පාලක තැන්පත් ජෝන් ක්ලැරන්ස් ලක්ෂ්මන් මෙල්ඩර් ගුණරත්න වන මම, 1950 අංක 29 දරණ මිළ පාලන පනතේ 3(2) දරණ වගන්තිය සමඟ කියවිය යුතු 4 වැනි වගන්තියෙන් මට පැවරී තිබෙන බලතල අනුව—

(1) 1958 අගෝස්තු 27 වෙනි දින අංක 11,505 දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 1958 අගෝස්තු 23 වැනි දිනය හා අංක අ. 43 දරණ ආහාර මිළ නියෝගයේ උපලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් උම්බලකඩ පිළිබඳව එම උපලේඛනයේ 2(i) සහ (ii) සහ 3(i) සහ (ii) වෙනි තීරවල පිළිවෙලින් දැක්වෙන තොග වෙළෙන්දෙකු විසින් තොග වශයෙන් විකිණීමේ වැඩිම මිළද, සිල්ලර වෙළෙන්දෙකු විසින් සිල්ලර වශයෙන් විකිණීමේ වැඩිම මිළද, මෙම නියෝගයෙන් අද දින සිට අවලංගු කරමි:

(2) තොග වෙළෙන්දෙකු විසින් තොග වශයෙන් විකිණීමේදී උම්බලකඩ ශුද්ධ බර හොණ්ඩරයක්ද, සිල්ලර වෙළෙන්දෙකු විසින් සිල්ලර වශයෙන් පාරිභෝගිකයෙකුට විකිණීමේදී උම්බලකඩ ශුද්ධ බර රාත්තලක්ද, මේ උපලේඛනයේ 2 සහ 3 යන තීරවල සඳහන් ප්‍රදේශයන් ඇතුළත විකිණිය හැකි වැඩිම මිළ, මේ දැන් පටන්, මේ උපලේඛනයේ 2(i) සහ (ii) සහ 3(i) සහ (ii) යන තීරවල පිළිවෙළින් සඳහන් කර තිබෙන මිළ ගණන් බව මෙම නියෝගයෙන් නියම කරමි.

(3) තවද, මෙම නියෝගයේ කාර්‍ය්‍ය සඳහා—

(අ) උම්බලකඩ ඕනෑම ප්‍රමාණයක් නැවත විකිණීම සඳහා විකිණීම තොග වශයෙන් විකිණීමක් ලෙස සලකන බවත්;

(ආ) උම්බලකඩ ඕනෑම ප්‍රමාණයක් පරිභෝගය පිණිස හෝ පාවිච්චිය පිණිස විකිණීම සිල්ලර වශයෙන් විකිණීමක් ලෙස සලකන බවත්;

(ඇ) තොග වශයෙන් විකුණන ශුද්ධ බර හොණ්ඩරයකට අඩු හෝ වැඩි ඕනෑම උම්බලකඩ ප්‍රමාණයකට ගෙවිය යුතු වැඩිම මුදල ගණන්ගනු ලබන්නේ මෙහි සඳහන් ශුද්ධ බර හොණ්ඩරයක් තොග වශයෙන් විකිණීමේ වැඩිම මිළ අනුව බවත් මෙම නියෝග යෙන් නියම කරමි.

(4) එසේම මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයක්ම ඇතුළත උම්බලකඩ වෙන ද්‍රව්‍යයක් සමඟ මිශ්‍ර කිරීමෙන් බාලකොට කිසිවෙකු විසින් නොවිකිණිය යුතු බව නියම කරමි.

(5) තවද මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයක්ම ඇතුළත, යම් ස්ථානයක හෝ වාහනයක උපලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් උම්බලකඩ සිය ස්වාමිත්වය හෝ පාලනය යටතේ තබාගෙන සිටින සෑම වෙළෙන්දෙකුට මෙම නියෝගයෙන් නියමිත වැඩිම මිළ ගණන් සටහන් කරනලද දැන්වීමක් එකී ස්ථානයේ හෝ වාහනයේ ප්‍රකටව පෙනෙන පරිදි තැබිය යුතු බව නියම කරමි.

(6) එසේම, මෙම නියෝගයේ කාර්‍ය්‍ය සඳහා "රාත්තල" හෙවත් "රා." යන්නෙන් සලකනු ලබන්නේ ඇවර්දූපොයි බරක්‍රමය අනුව සම්මත රාත්තලේ බර බවද නියම කරමි.

(7) එසේම මෙම නියෝගයෙන් වැඩිම මිළ නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම, උම්බලකඩ තොග වශයෙන් විකුණන සෑම තැනැත්තෙකු හා සිල්ලර වශයෙන් විකුණන සෑම තැනැත්තෙකුම මිළයට ගන්නා ඉල්ලුවහොත් පහත සඳහන් විස්තර, එනම් :—

(අ) විකුණූ දිනය;
(ආ) විකුණූ උම්බලකඩ ප්‍රමාණය (බර අනුවයි);
(ඇ) විකුණූ ප්‍රමාණය සඳහා ගෙවූ මුදල;
(ඈ) වෙළඳාමේ ස්වභාවය, එනම් වෙළඳාම තොග වශයෙන්ද සිල්ලර වශයෙන්ද යන වග ඇතුළත් කුවිතාන්සියක් දිය යුතු බවද නියම කරමි.

(8) උම්බලකඩ විකුණන විට එය ඔතා හෝ බහා දෙන යම්කිසි දෙයක් වෙතොත් එහි මිළත් උපලේඛනයේ 2(i) සහ (ii) සහ 3(i) සහ (ii) යන තීරවල සඳහන් වැඩිම මිළ ගණන්වලට ඇතුළත්වී ඇති බවද නියම කරමි.

1959 පෙබරවාරි 3 වැනි දින පස්වරු 10 අනුරාධපුරයේදී අත්සන් තබන ලදි.

ජේ. සී. ඇල්. ඇම්. ගුණරත්න,
අනුරාධපුර දිස්ත්‍රික්කයේ සහකාර (ආහාර) මිළ පාලක තැන.

## පළමුවන උපලේඛනය

| 1 වැනි තීරය | 2 වැනි තීරය | | 3 වැනි තීරය | |
|---|---|---|---|---|
| | (1) අංක 23සී දරණ තුලාන ඇතුළත්ව අනුරාධපුර නගර සභා සීමාවන් සහ කැකිරාව සුළු නගර සභා සීමාවන් ඇතුළත | | (2) අනුරාධපුර නගර සභා සීමාවන්, අංක 23 සී. දරණ තුලාන සහ කැකිරාව සුළු නගරසභා සීමාවන් හැර අනුරාධපුර පාලන දිස්ත්‍රික්කයා ඇතුළත | |
| | (i) | (ii) | (i) | (ii) |
| විස්තර | තොග වෙළෙන්දෙකු විසින් ශුද්ධ බර හොණ්ඩරයක් තොගවශයෙන් විකිණිය හැකි වැඩිම මිළ | සිල්ලර වෙළෙන්දෙකු විසින් ශුද්ධබර රාත්තලක් සිල්ලර වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ | තොග වෙළෙන්දෙකු විසින් ශුද්ධ බර හොණ්ඩරයක් තොග වශයෙප විකිණිය හැකි වැඩිම මිළ | සිල්ලර වෙළෙන්දෙකු විසින් ශුද්ධ බර රාත්තලක් සිල්ලර වශයෙන් විකිණිය හැකි වැඩිය මිළ |
| | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. |
| උම්බලකඩ (සියලුම වර්ගවල) ... | ... 247 20 | ... 2 46 | ... 247 45 | ... 2 47 |

**සැළකිය යුතුයි.**—මේ මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍යය විකිණීමේ නියමිත මිළ නොවේ. මේවා ද්‍රව්‍ය විකිණිය හැකි වැඩිම මිළ වේ. එකී මිළට වැඩියෙන් නොවිකිණිය යුතුයි.

---

**ඇම්. ඇන් 6/1959 වැනි අංකය දරන ආහාර මිළ නියෝගය.**

**හාල් සහ වී**

## 1950 අංක 29 දරන මිළ පාලන පනත

### නියොගය

මන්නාරම් දිස්ත්‍රික්කයේ (ආහාර) සහකාර මිළ පාලක තැන්පත් සන්මුගම් පරමනාදන් වන මම, 1950 අංක 29 දරණ මිළ පාලන පනතේ 4 වැනි සහ 3 (2) යන කොටස් වලින් මාවෙත පැවරී තිබෙන බලතල අනුව—

(1) 1958 ජූනි 11 වැනි දින හා 11,354 වැනි අංකය දරණ ලංකා ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළකරන ලද ජූනි 1 වැනි දිනය හා ඇම් ඇන්/5වැනි අංකය දරණ ආහාර මිළ නියෝග අද දින සිට මෙයින් අවලංගු කරමි.

(2) මීට යාකර ඇති 1වැනි උපලේඛනයේ 2 වැනි සහ 3 වැනි තීරවල සඳහන් සලාක පොත් වලට දෙන හාල් සහ වී වෙන වෙනම තොගවශයෙන් විකිණීමේදී දළ බර හොණ්ඩරයක මිළ එම උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් ප්‍රදේශවල විකිණිය හැකි වැඩිම මිළ බව මෙම නියෝගයෙන් නියම කරමි.

(3) මීට යාකර ඇති 2 වැනි උපලේඛනයේ 2 වැනි සහ 3 වැනි තීරවල සඳහන් සලාක පොත් වලට දෙන හාල් සහ වී සිල්ලර වශයෙන් විකිණීමේදී ශුද්ධ බර රාත්තලක මිළ එම උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් ප්‍රදේශවල විකිණිය හැකි වැඩිම මිළ බව මෙම නියෝගයෙන් නියම කරමි.

(4) තවද මෙම නියෝගයේ කාර්‍ය්‍ය සඳහා—

(අ) මෙම උපලේඛනවල 2 වැනි සහ 3 වැනි තීරවල සඳහන් සලාක පොත් වලට දෙන හාල් සහ වී ඔනෑ ම ප්‍රමාණයක් නැවත විකිණීම සඳහා විකිණීම හෝ එම උපලේඛනවල 2 වැනි සහ 3 වැනි තීරවල සඳහන් ද්‍රව්‍යයක් වරකට දළ බර හොණ්ඩරයකට වැඩි ප්‍රමාණය බැගින් කොයි අන්දමට විකිණීම හෝ තොගවශයෙන් විකිණීමක් ලෙස සලකනු ලබන බවත්;

(ආ) උපලේඛනවල සඳහන් සලාක පොත් වලට දෙන හාල් සහ වී පරිභෝගය පිණිස හෝ පාවිච්චිය පිණිස හෝ දළ බර හොණ්ඩරයකට අඩු ඕනෑම ප්‍රමාණයක් සිල්ලර වශයෙන් විකිණීමක් ලෙස සලකනු ලබන බවත් මෙම නියෝගයෙන් නියම කරමි.

(5) එසේම මෙම උපලේඛනවල සඳහන් සලාක පොත් වලට දෙන හාල් සහ වී තවත් ද්‍රව්‍යයක් සමග මිශ්‍ර කිරීමෙන් බාලකොට කිසිවෙකු විසින් නොවිකිණිය යුතුබව නියම කරමි.

(6) මෙහි උපලේඛනවල 2 වැනි සහ 3 වැනි තීරවල සඳහන් සලාක පොත් වලට දෙන හාල් සහ වී විකුණන විට ඒ විකුණනු ලබන දෙය යම්කිසි දෙයක ඔතනු ලැබේනම් නැතහොත් බහාලනු ලැබේනම් එහි මිළත් මෙහි උපලේඛනවල 2 වැනි සහ 3 වැනි තීරවල සඳහන් වැඩිම මිළ ගණන් වලට ඇතුළත් වන බවද නියම කරමි.

(7) එසේම මෙම උපලේඛනවල 1 වැනි තීරයේ සඳහන් ප්‍රදේශවල සලාක පොත් වලට දෙන හාල් සහ වී සිය ස්වාමිත්වයේ හෝ පාලනය යටතේ තබාගෙන සිටින සෑම වෙළෙන්දෙකුම එකී හාල් සහ වී සම්බන්ධයෙන් මෙම නියෝගයෙන් නියමිත වැඩිම මිළ ගණන් සටහන් කරන ලද දැන්වීමක් එකී ස්ථානවල ප්‍රකටව පෙනෙන පරිදි තැබිය යුතුබව නියම කරමි.

(8) එසේම මෙම නියෝගයේ කාර්‍ය සඳහා රාත්තල හෙවත් " රා. " යන්නෙන් සලකනු ලබන්නේ ඇවරදූපොයි බර ක්‍රමය අනුව සම්මත රාත්තලේ බර බවද නියම කරමි.

(9) මෙහි ඇතුළත් උපලේඛනවල 1 වැනි තීරයේ සඳහන් ප්‍රදේශවල එම උපලේඛනයේ 2 වැනි සහ 3 වැනි තීරවල සඳහන් සලාක පොත් වලට දෙන හාල් සහ වී තොග වශයෙන් විකුණන සෑම වෙළෙන්දෙකු සහ එම උපලේඛනයේ 2 වැනි සහ 3 වැනි තීරවල සඳහන් හාල් සහ වී සිල්ලර වශයෙන් විකුණන සෑම තැනැත්තෙකු විසින්ම මිළට ගන්නා ඉල්ලුවහොත් පහත සඳහන් විස්තර එනම් :—

(අ) විකුණූ දිනය;

(ආ) සලාක පොත් වලට දෙන ලද හාල් සහ වී විකුණූ ප්‍රමාණය;

(ඇ) විකුණූ ප්‍රමාණය සඳහා ගෙවූ මුදල ;

(ඈ) වෙළඳාමේ, ස්වභාවය එනම් වෙළඳම තොග වශයෙන්ද සිල්ලර වශයෙන්ද යන වග ඇතුළත් කුවිතාන්සියක් මිළයට ගන්නාට දිය යුතු බවද නියම කරමි.

1959 පෙබරවාරි මස 3 වැනි දින පෙරවරු 11ට මන්නාරම් කච්චේරියේදී අත්සන් කරන ලදී.

ඇස්. පරමනාදන්,
මන්නාරම දිස්ත්‍රික්කයේ (ආහාර) සහකාර මිල පාලක තැන.

## 1 වැනි උපලේඛනය

| 1 වැනි තීරය | 2 වැනි තීරය | 3 වැනි තීරය |
|---|---|---|
| ප්‍රදේශය | හාල් | වී |
| | දළ බර හොණ්ඩරයක් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ | දළ බර හොණ්ඩරයක් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ |
| | රු. ශ. | රු. ශ. |
| මන්නාරම් සුළුනගර සීමාව ... ... ... ... | 20 31 | 10 15½ |
| ගම්කාර්‍ය සභා සීමාව මන්නාරම්, බටහිර (තලේමනා ගම්මුලාදෑණි ප්‍රදේශය) | 20 80 | 10 40 |
| නානාඩ්ඩන්, නැගෙනහිර ... ... ... ... | 20 04 | 10 02 |
| මුසලි දකුණ ... ... ... ... | 20 31 | 10 15½ |

## 2 වැනි උපලේඛනය

| 1 වැනි තීරය | 2 වැනි තීරය | 3 වැනි තීරය |
|---|---|---|
| ප්‍රදේශය | හාල් | වී |
| | ශුද්ධ බර රාත්තලක් සිල්ලර වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ | ශුද්ධ බර රාත්තලක් සිල්ලර වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ |
| | රු. ශ. | රු. ශ. |
| මන්නාරම් සුළුනගර සීමාව ... ... ... | 0 19 | 0 09½ |
| ගම්කාර්‍ය සභා සීමාව මන්නාරම, බටහිර (තලේමනා ගම්මුලාදෑනි ප්‍රදේශය හැර) | 0 19 | 0 09½ |
| මන්නාරම බටහිර (තලේමනා ගම්මුලාදෑනි ප්‍රදේශය) ... ... | 0 19¼ | 0 09⅝ |
| ඉරුකුලම්පිටි ... ... ... ... | 0 19 | 0 09½ |
| මන්නාරම නැගෙනහිර ... ... ... ... | 0 19 | 0 09½ |
| මාන්තෙ දකුණ ... ... ... ... | 0 19 | 0 09½ |
| මාන්තෙ උතුර ... ... ... ... | 0 19 | 0 09½ |
| පෙරුන්කාලිපත්තු (විඩතල්තිව් ගම්මුලාදෑනි ප්‍රදේශය හැර) ... ... | 0 19 | 0 09½ |
| පෙරුන්කාලිපත්තු (විඩතල්තිව් ගම්මුලාදෑනි ප්‍රදේශය) ... ... | 0 19¼ | 0 09⅝ |
| ඉලුප්පකඩවයි ... ... ... ... | 0 19½ | 0 09¾ |
| පනන්කාමම් ... ... ... ... | 0 19½ | 0 09¾ |
| මෛත්තුමුලෙයි ... ... ... ... | 0 19½ | 0 09¾ |
| මුසලි උතුර (මරිච්චිකඩ් ගම්මුලාදෑනි ප්‍රදේශය) ... ... | 0 19½ | 0 09¾ |
| මුසලි දකුණ (මරිච්චිකඩ් ගම්මුලාදෑනි ප්‍රදේශය හැර) ... ... | 0 19¼ | 0 09⅞ |
| නානාඩ්ඩන් බටහිර ... ... ... ... | 0 18½ | 0 09¼ |
| නානාඩ්ඩන් නැගෙනහිර ... ... ... ... | 0 18½ | 0 09¼ |
| වන්කාලයි ... ... ... ... | 0 19 | 0 09½ |

**සැළකිය යුතුයි**—. මේ මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍යය විකිණීමේ නියමිත මිළ නොවේ. මේවා ඒ ඒ ද්‍රව්‍යය විකිණිය හැකි ඉතාම වැඩි මිළ ගණන්ය. මේ මිල ගණන් වලට ඉහලින් ඒ ද්‍රව්‍යය විකිණිය නොහැකිය.

සලාක පොත් වලට දෙනු ලබන හාල් සහ වී තොග වශයෙන් විකිණීමේදී රාත්තල් 160කට අඩුනම් ඊට ගෙවිය යුතු වැඩිම මිළ ඉහත සඳහන් උපලේඛනයේ හොණ්ඩරයක් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිල අනුව සසඳ බලාගත යුතුය.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.